# නව සම සමාජ පක්ෂය
# நவ சம சமாஜ கட்சி
# NAVA SAMA SAMAJA PARTY

4 වන ජාත්‍යන්තරයේ ශාඛාව
4 வது அகிலத்தின் கிளை
Section of the 4th international

17, බැරැක්ක පටුමග, කොළඹ 02. இல.17, பெரக் ஒழுங்கை, கொழும்பு 02. 17, Barrack Lane, Colombo 02.
Tel:. 011 2430621 Fax:011 2305963 email - nssp.lk@gmail.com Web:www.nssp.info


2023.07.25

**<u>පුවත්පත් නිවේදනය - සියළු ජනමාධ්‍ය වෙත</u>**

'කළු ජූලියට' වසර 40 ක් පිරීම සිහිපත් කරමින් සමාජවාදී තරුණ සංගමය සහ තවත් සිවිල් සංවිධාන කිහිපයක් එක්ව පසුගිය ජූලි 23 දින කොළඹ දී සංවිධානය කර තිබූ අනුස්මරණයට සහ එම ජාතිවාදී ප්‍රහාර මාලාවට විරෝධය පළ කිරීමේ උද්ඝෝෂණයට එල්ල කළ මැර ප්‍රහාරය නව සම සමාජ පක්ෂය දැඩිසේ හෙලා දකී.

දශක ගණනාවක් තිස්සේ දෙමළ ජනතාවගෙන් උදුරාගනු ලැබූ අයිතිවාසිකම් නැවත ලබා දීම වෙනුවෙන් සාකච්ඡාවක් ගොඩනැගිය යුතු මොහොතක, විශේෂයෙන් දකුණේ එයට හිතකාමී ලෙස නැගෙන උද්ඝෝෂණ මර්දනය කිරීම සමස්ථ දිවයිනේම අනාගතය අඳුරට ඇද දමන ක්‍රියාමාර්ගයක් බව අපගේ අදහසයි.

දෙමළ ජනතාවගේ උරුමයන් සුරැකීම වෙනුවට එම ජනතාව පාගාදමනු ලැබ තිබීම අඛණ්ඩව පවත්වාගන යෑමේ නින්දිත පරමාර්ථය වෙනුවෙන් එදා මෙම මැර ප්‍රහාරය සංවිධානය කරන ලද බව ගැන කිසිදු සැකයක් නැත.

ලංකා ඉතිහාසයේ දරුණුතම කැළලක් වන 1983 ජූලියේදී දෙමළ ජනතාවට එල්ල කළ සිංහල ජාතිවාදී ප්‍රහාර සම්බන්ධයෙන් තම කම්පාව යලි යලිත් ප්‍රකට කරමින්, සිවිල් සංවිධාන හා මානව හිමිකම් ක්‍රියාධරයන් දෙමළ ජනතාවගේ ස්වපාලන අයිතීන් වෙනුවෙන් සමාජයට ආමන්ත්‍රණය කරද්දී, එම පිවරයන් ආරක්ෂා කිරීම හා එවන් සියළුම කටයුතු ප්‍රවර්ධනය කිරීම අද දවසේ අවශ්‍යතාවයයි.

බලහත්කාරයෙන් අතුරුදහන්කරනු ලැබූවන්, ඉඩම් අත්පත්කරගැනීම්, දේශපාලන සිරකරුවන්, සිවිල් පාලනයට දිගින් දිගටම සිදු කෙරෙන හමුදාවේ මැදිහත්වීම් යන ආසන්න ප්‍රශ්න වලට විසඳුම් ලබා දීම සඳහා ඒකාබද්ධ උද්ඝෝෂණයන් අඛණ්ඩව ගෙන යෑමට ක්‍රියාකිරීම දවසේ අවශ්‍යතාවය වන්නේ ය.

වස්තුභංගත්වයට පත් දුර්භාගය සම්පන්න මේ භූමියට සමාජ ආර්ථික වෘධිය හා මිනිස්කම ගෙන ආ හැකි මාවත වන්නේ යුක්තිය, සාධාරණත්වය හා ස්වපාලනය මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රීය බලය බෙදා ගැනීමේ පියවරයන් හරහා, පවතින ව්‍යසනකාරී ඒකීය රාජ්‍ය පුපුරුවා හැරීම මගින් පමණකි.



**නව සම සමාජ පක්ෂයේ දේශපාලන මණ්ඩලය වෙනුවෙන්**